වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික සභාව - 2019
--------------------------------------------------------------

## 1. මතය
-------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණු පිරිවැය රු.1,800,000 ක්වූ ස්ථාවර වත්කම්වල ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම පිරිවැය සහිත මෝටර් රථය සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ අතර එහි ප්‍රත්‍යාගණන අගය නැවත පොත්වලට ගැනීමට තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් එම ක්ෂය සඳහා ගැලපීම ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් සහ ක්ෂය පිළිබඳ ගිණුම් තැබීමේදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුගතවිය යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2018** හා එයට පෙර වර්ෂවලදී ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව වැඩිහිටි සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු අත්තිකාරම් ඉකුත් වර්ෂවල වියදම් ලෙස හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී එම අත්තිකාරම් මුදල්වලින් ඉතිරිවීම් ලෙස රු.**2,615,078** ක් නැවත ආපසු එවා තිබුණි. එසේ වුවත් මෙම ඉතිරිවීම් වියදම්වලට නැවත ගැලපීමක් සඳහා පූර්ව වර්ෂ ගැලපීම් ලෙස සමුච්චිත අතිරික්තයට ගැලපීම වෙනුවට ලේකම් කාර්යාලය විසින් එම ඉතිරිය ජංගම වගකීම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ලැබිය යුතු අධිභාර (surcharge receivable) ලෙස දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි එම ශේෂය ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් සමුච්චිත අතිරික්තයට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අක්ෂි සහ ශ්‍රවණ උපකරණ ලබාදීම | රු. **7,000,000** | සමාලෝචිත වර්ෂයේ අවුරුදු 60 ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට අක්ෂිකාච සහ ශ්‍රවණ උපකරණ ලබාදීමට සමාජ ආරක්ෂණ අරමුදලින් ප්‍රතිපාදනය කර තිබුණ රු.19,000,000ක මුදලින් අබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු රු.**7,000,000** ක මුදල ජාතික සභාවේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබූ නමුත් එම වියදමට අදාල උපයෝගී ලියවිලි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අවුරුදු **60**ට වැඩි ආබාධිත තැනැත්තන් සඳහා ඇස් කන්ණාඩි ලබා දීමට ජාතික සභා අනුමැතියක් ලබා ගැනීමෙන් පසු රු.මිලියන **07** ක් ආබාධිත මහලේකම් කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කරන ලදි. | ආයතනයේ සමාජ ආරක්ෂණ අරමුදලින් වෙනත් ආයතනවල කටයුතු සිදුකිරීමට ප්‍රතිපාදන වෙන්කර නොතිබුණද වියදම් සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.5.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය | චක්‍රලේඛයේ 5.1.2 දැක්වෙන කරුණු ඇතුළත්ව සංයුක්ත සැළැස්මක් සකස් කළ යුතු වුවද, ආයතනය 2019 වර්ෂය ඇතුළත් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි. | වර්ෂ 03ක් පදනම් කර ගනිමින් සංයුක්ත සැලැස්මක් මේ වනවිට පිළියෙල කර නොමැති අතර 2021 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් සකස්කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව දක්වා තිබුණි. | මහ ලේකම් කාර්යාලයේ දීර්ඝ කාලීන සැළසුම් ඇතුළත් සංයුක්ත සැලැස්ම සකස් කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,861,899 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,867,929 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,006,030 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30ක් මගින් අවකරණය කර ගන්නා ලද වැඩිහිටි දීමනාව රු.3,724,800 ක් වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබාදී නොතිබූ අතර වර්ෂ 1 ට වඩා වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි. | එම මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අවකරණය කරන ලද මුදල් අප්‍රමාදව ගෙන්වා ගැනීමට කටයුතු කලයුතු බව. |
| (ආ) | ජාතික සභාවේ පනතට අනුව වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන කරන ලද සංඛ්‍යා ලේඛණ පවත්වාගෙන යාම සභාවේ එක් කාර්යයක් වන අතර ඒ සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යායුතු බවට පොදු ව්‍යාපාර කාරක සභාවේ 2016 පෙබරවාරි 11 දින පැවති රැස්වීමේදී | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිළිබඳ කළමනාකරණ තොරතුරු පද්ධතිය මේ වනවිට සකස් කර ඇති අතර වැඩිහිටි දීමනා ලබා දීම සඳහා වන පුද්ගල ලේඛණ මේ වනවිට යාවත්කාලීන කරමින් පවතී. | වැඩිහිටි තැනැත්තන් පිළිබඳව නිවැරදි හා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතිය කඩිනමින් සකස් කරගත යුතු වීම. |

උපදෙස් ලබාදී තිබුණි. ඉකුත් වර්ෂයේදී වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලින් රු.2,000,000 ක් ලබාගෙන දත්ත පද්ධතිය සකස් කිරීමට අනුමත කර ගෙන තිබුණු නමුත් 2020 නොවැම්බර් මාසය දක්වාම වැඩිහිටි තැනැත්තන් පිළිබඳ තොරතුරු ඇතුළත් ක්‍රමවත්, යාවත්කාලීන දත්ත පද්ධතියක් නොතිබුණි.

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් වයස අවුරුදු 70 ට වැඩි අඩු ආදායම් ලාභී වැඩිහිටියන් වෙනුවෙන් ලබාදෙන රු.2,000 දීමනාවෙන් රු.100 ක් අවකරණය කර ගනු ලබන අතර 2019 දෙසැම්බර් 31 දිනට එම අවකරණ මුදල් එකතුවෙන් ගොඩනැගී තිබූ අරමුදලේ ශේෂය රු.1,931,745,249 ක් වී තිබුණි. මෙම අරමුදල 2016 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර අරමුදලින් කළයුතු කාර්යයන් 10 ක් පිළිබඳව 2016 අගෝස්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නිශ්වය කර තිබුණි. කෙසේවුවද එම කාර්යයන් කිසිවක් පසුගිය වර්ෂ 03 තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී වැඩිහිටියන් වෙනුවෙන් සුභසාධන කාර්යයන් 11 ක් ඇතුළත් ක්‍රියාකාරී සැළසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,402,310,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. කාර්ය සාධන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම සුභසාධන කටයුතු ඉටුකිරීම සඳහා රු.297,226,130 හෙවත් සියයට 21ක් පමණක් උපයෝජනය කර තිබුණි. | මෙම සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අනුමැතිය ලැබී ඇත්තේ සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 09 දින පැවති ජාතික සභාව රැස්වීමේදී වේ. එබැවින් වර්ෂය සඳහාම සැලසුම් කරන ලද සුභසාධන වැඩසටහන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගත නොහැකි විය. | සැළසුම් කළ පරිදි කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අඩු අදායම්ලාභී වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන් 662 ක් සඳහා රු.20,000 බැගින් ස්වයං රැකියා ආධාර මුදල් ලබාදීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම මගින් ප්‍රතිපාදනය කර තිබූ රු.13,240,000 කින් රු.2,293,307ක් උපයෝජනය කර නොතිබුණි.එසේම සමාලෝචිත වර්ෂයේ සමාජ ආරක්ෂණ අරමුදල මගින් දිවයින පුරා වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 175 ක් අලුතින් ඉදිකිරීම හෝ අළුත්වැඩියා සඳහා සහ අත්‍යවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා රු.437,500,000ක් ප්‍රතිපාදනය කර තිබුණද එම මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.366,577,802 ක් හෙවත් සියයට 84 ක් ඉතිරිව පැවතුණි . | ස්වයං රැකියා ආධාර ඉල්ලීම් අනුව මුදල් ලබාදුන් අතර සමාජ ආරක්ෂණ අරමුදල මඟින් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 175ක් සඳහා ප්‍රතිපාදන ලබා දීමට ජාතික සභාව මඟින් යෝජනා කර අනුමත කරන ලදී. එහිදී වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම හා අලුත් වැඩියාව සඳහා දිස්ත්‍රික් මට්ටමින් ලබාගත් නිර්ණායක සම්පූර්ණ කරන ලද ඉල්ලීම් සඳහා පමණක් මුදල් නිදහස් කර ඇති බව දක්වා තිබුණි. | වර්ෂය සඳහා අදාල කාර්යයන් ඉටුකිරීමට ප්‍රතිපාදන වෙන්කර ගැනීම මෙන්ම සැළසුම් අනුව ඉල්ලුම් කිරීම් සම්බන්ධව අවධානය යොමු කළ යුතු වීම. |
| (ඇ) | වයස අවුරුදු 75 දක්වාවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකිරීම සහ අවුරුදු 65 ඉක්මවූ වැඩිහිටියන් වෙනුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ සඳහා ලබාදී තිබූ රු.5,000,000 න් වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා 2016 වර්ෂයේදී රු.3,305,836 ක් වැය කර තිබුණු අතර ඉතිරිය වූ රු.1,694,164 ක් විවිධ තැන්පත් ගිණුමේ 2020 නොවැම්බර් 17 දින දක්වාම රඳවාගෙන තිබුණි. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීමට විගණන දිනයවූ 2020 නොවැම්බර් 17 දිනවන විට වර්ෂ 04 කට අධික කාලයක් ගතවී තිබුණු නමුත් එම ප්‍රකාශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සඳහා මේ වන විට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර මීළඟ පියවර ලෙස ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දක්වා තිබුණි. | මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමත් වර්ෂ 03 කට වැඩිකාලයක් ගතවී ඇති බැවින් කඩිනමින් අවසන් කිරීමට සැළසුම් කර ගත යුතු වීම. |

**3.3** නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා **2011** වර්ෂයේදී තෑගි ඔප්පුවක් මගින් ආයතනයට ලබා දී තිබූ තක්සේරු වටිනාකම රු.**13,000,000** ක් වූ ගම්පහ හෝලික්‍රොස් ඉඩම සහ රු.**3,200,000** ක්වූ හාරගම රාජිත වත්ත යන ඉඩම් අදාල කාර්ය ඉටුකර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් නිශ්ක්‍රීයව පැවතිණි. | ඉඩම් හුවමාරුවෙන් පසු ගම්පහ හෝලික්‍රොස් ඉඩමට අදාල සම්පූර්ණ සැලැස්මක් නොමැති වූ බැවින් ඉදිරියේදී ඉඩම් අත්පත් කර ගැනිමේ ක්‍රියාදාමයට පිවිසීමට ප්‍රථමව මෙම ඉඩම පිළිබඳ සම්පූර්ණ සැලැස්මක් සකස් කර ගැනීම සඳහා සුදුසුකම් ලත් මිනින්දෝරුවරුන් ගෙන් ඊට අදාල මිළ ගණන් කැඳවා ඇත. | මහ ලේකම් කාර්යාලයට ලබාදී ඇති ඉඩම් සුභ සාධන කටයුතු සඳහා උපයෝජනය කළ යුතු වීම. |

**3.4** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිළධාරි තනතුර මහලේකම් කාර්යාලය ආරම්භක අවස්ථාවේ සිට පුරප්පාඩුව පැවති අතර සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට **2017** ජනවාරි **11** දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද **2020** නොවැම්බර් දක්වා එම පුරප්පාඩු සඳහා නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටිය **2011** ජනවාරි **31** වන දින සහ **2017** ජූලි **06** දින අනුමත කර ඇත. නැවතත් මෙම තනතුරු පූර්ණ කාලීන තනතුරු ලෙස සකස්කර දෙන මෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම කර ඇති අතර අදාල සංශෝධනයන් සිදු කළ වහාම එම තනතුරු බඳවා ගැනීම සිදු කරනු ලැබේ. . | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන අනුමත තනතුරු සඳහා අප්‍රමාදව බඳවා ගැනීම් සිදුකළ යුතු වීම. |